# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/10 - 2019 පෙබරවාරි මස 12 වැනි අඟහරුවාදා - 2019.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

1963 අංක : 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහනවයක් වූ පෙබරවාරි මස 12 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක : 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2019 පෙබරවාරි මස 12 වන දින,
කොළඹ දී ය.

***උපලේඛනය***

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සීතාවක ප්‍රාදේශීය සභා සීමාවේ, අංක : 455 වේරගල ග්‍රාම නිලධාරී වසමේ, වේරගල ගම පිහිටි බලයලත් මිනින්දෝරු යූ. තිලකා නන්දනී විසින් 2018.04.05 දින මැන සාදන ලද අංක : 45/2018 දරන පිඹුරේ ප්‍රකාර ''ඇටහෙරලියගහලන්ද කැබැල්ල'' නැමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ලොට් $1^A$ නැමැති බිම් කොටස වන උතුරට : P. P. කො 9670 හි ලොට් 131 බිම් කොටස (පාර සඳහා වෙන්කිරීම), නැගෙනහිරට අංක : 1188 දරන පිඹුරේ දක්වෙන ලොට් $2^B$ බිම් කොටස, දකුණට : ජේ. අයි. එදිරිසිංහ ට අයත් එම ඉඩමේ ම ඉතිරි කොටස, බස්නාහිරට : එල් කල්දේරා ට අයත් එම ඉඩමේ ම ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.03089 හෙවත් අ : 0 - රූ : 0 - ප : 12.21 ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ මත පිහිටි සියලු දේත් වේ.

ඉහත සඳහන් ඉඩම් කොටස මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කරන ලද කොටසකි.

ඉහත කී අංක : 455 වේරගල ග්‍රාම නිලධාරී වසමේ වේරගල ගමෙහි පිහිටි ''ඇටහෙරලියගහලන්ද කැබැල්ල'' නැමැති ඉඩමට යූ. තිලකා නන්දනී බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක : 3605 සහ 2009.08.16 දින දරන සැලැස්මේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක : 1 දරන බිම් කොටස වන උතුරට පාදුක්ක සිට ඉංගිරිය දක්වා ප්‍රධාන පාර ද, නැගෙනහිරට අංක : 1188 දරන සැලැස්මේ සඳහන් අංක : 2 දරන බිම් කොටස ද, දකුණට ජේ. අයි. එදිරිසිංහ ට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස ද බස්නාහිරට එල් කල්දේරා ට අයිති මෙම ඉඩමේ කොටසක් ද යන මෙකී මායිම් තුළ පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, ප. 13) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පලතුරු ආදී සියළු දේ ද, එහි තුළ පිහිටි නිවස ද වේ.

ඉහත කී ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 424/119 පිටුවේ ලියාපදිංචි වී ඇත.

03 - 41


1A - PG 4386 — 117 (2019/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*